# සාම්ප්‍රදායික වේවැල් කර්මාන්තයේ වර්තමාන තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

(ගම්පහ දිස්ත්‍රික්කයේ රදාවඩුන්න ග්‍රාමය ඇසුරින්)


කේ.ඒ.එච්. නුවන්තිකා කස්තුරිරත්න

තෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

*hirunuwanthika@gmail.com*


## හැඳින්වීම

අතීතයේ ජීවත් වූ මුතුන්මිත්තෝ ස්වභාදහමට දැඩි ලෙස ඇළුම් කළහ. ඔවුහු තම දිවි දෙ වැනි කොට පරිසරය රැක ගත්හ. එකල ඔවුන් නිපද වූ කිසිවක් පරිසරයට අහිතකර ඒවා නොවී ය. ඒ අනුව නව පරපුරට ඔවුන්ගෙන් දායාද වූ පරිසර හිතකාමී නිර්මාණ බොහෝමයකි. මැටි, වේවැල්, දැව ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස අත්‍යවශ්‍ය භාණ්ඩ බොහෝමයක දැකගත හැකිවි ය. මෙම අමුද්‍රව්‍ය මූලික කරගත් හස්ත කර්මාන්ත පැවතුණි. ඒ අතර වේවැල් කර්මාන්තය ප්‍රධාන තැනක් ගන්නා අතර මෙරට පවත්නා සුළු කර්මාන්ත අතර සාම්ප්‍රදායික හස්ත කර්මාන්තයක් ලෙස වේවැල් කර්මාන්තයට පෙන්වාදිය හැකි ය. ලංකාවේ වේවැල් බහුල ව දක්නට ලැබුණු බැව් වේවැල්දූව, වේවැල්කඳුර, වේවැල්වල හා වේවැල්දෙණිය යන ග්‍රාම නාමවලින් ‍හෙළිවන බව සිංහල විශ්වකෝෂය පෙන්වාදෙයි. වේවැල් කර්මාන්තය ශ්‍රී ලංකාවේ දිගු ඉතිහාසයකට උරුමකම් කියන කර්මාන්තයකි. මෙය කොතරම් පැරණිවී ද යත් ඉතාම නොදියුණු ප්‍රමාණයේ ජීවත් වූ ජනයා පවා බඹර කැපීමේ දී අවශ්‍ය ඉණිමං සකසා ගැනීමට වේවැල් භාවිතයට ගත් බවට සාක්ෂි තිබේ. තව ද සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ලක්දිවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම කරවන අවස්ථාවේ ඒ සමඟ පැමිණි දහඅට කුලයට අයත් පිරිස අතර ''කුළු පොත්තන්'' නමින් හඳුන්වන ලද වේවැල් කර්මාන්තයේ නියැලෙන්නන් පිරිසක් සිට ඇති අතර ඔවුන් විවිධ ප්‍රදේශවල පදිංචි කරවා ඇති බව මහාවංශයේ දැක්වේ. පැරණි සිංහල ජන සමාජයේ ජීවත් වූ වේවැල් උපයෝගී කරගෙන විවිධ නිර්මාණ කළ බව රොබට් නොක්ස් දක්වා ඇත. වේවැල් වලින් නිමවූ අපූර්ව නිර්මාණ දෙස්විදෙස් ජනයාගේ ආකර්ෂණය දිනාගන්නා සේම මෙරට ජනයාගේ තාක්ෂණික ඥානය හා කලාත්මක හැකියාව විදහා දක්වයි.

## රඳාවඩුන්න ග්‍රාමයේ වේවැල් කර්මාන්තයේ ආරම්භය

ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වේවැල් කර්මාන්තය දිගු ඉතිහාසයකට හිමිකම් නොකීව ද එය පාරම්පරික කර්මාන්තයක් ලෙස මෑත ඉතිහාසයේ සිට පවත්වගෙන එනු ලබන්නකි. කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ ගමන් ගන්නාවිට මෙම ප්‍රදේශය හමුවේ. වරකාපොළ නගරයේ සිට කිලෝමීටර් 10ක් පමණ කොළඹ දෙසට වන්නට මෙම ග්‍රාමය පිහිටා ඇත. මෙම ප්‍රදේශය බොහෝ දෙනෙකු වේවැල්දෙණිය ලෙස හැඳින්වුව ද වේවැල්දෙණිය ඊට කිලෝමීටර් 3ක් පමණ ඈතින් පිහිටා ඇත. එහෙත් මෙම ප්‍රදේශයේ වේවැල් භාණ්ඩවලින් පිරි කඩසාප්පු නැත. කර්මාන්තයේ ආරම්භය සිදු ව ඇත්තේ වර්ෂ 1920-1930 වැනි කාළය තුළ ය. රඳාවඩුන්න ප්‍රදේශයේ මෙම කර්මාන්තය 1965 දී මෙම ගමේ ජීවත් වූ ධර්මදාස මහතා විසින් ආරම්භ කරන ලද්දක් යැයි සැලකේ. ඒ වන විට මුළු ප්‍රදේශයට ම තිබී ඇත්තේ වෙළඳසැල් දෙකක් පමණි. ඉන් එක් වෙළඳසැලක අයිතිකරු වී ඇත්තේ මුස්ලිම් ජාතිකයෙකි. ඔහු කුලියාපිටිය ප්‍රදේශයෙන් ගෙන්වන ලද වේවැල් විකුණන විසිතුරු භාණ්ඩ දුටු ධර්මදාස මහතාට ද මෙම ශිල්පය ඉගෙනගැනීමට කැමැත්තක් ඇති වූව ද ඔහුට එම ශිල්පය ලබාදීමට කිසිවෙක් කැමැත්තක් දක්වා නැත. 1976 දී පමණ කොළඹ දොන් කරෝලිස් සාප්පුවේ විකිණීමට දමා තිබූ ගෘහ භාණ්ඩ දැකබලා ගෙනැවිත් ස්වෝත්සාහයෙන් පුටු විවීම ආරම්භ කර පසුව රඳාවඩුන්න ගම්වාසීන් මෙම කර්මාන්තයට යොමුකර ගැනීමට සමත්වී ය.


## වේවැල් භාණ්ඩ නිෂ්පාදනය

වේවැල් භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය වේවැල් ය. අතීතයේ ගම අභ්‍යන්තරයට වන්නට කිලෝමීටර් 10ක් 15ක් පමණ ගමන් කළවිට අවශ්‍ය තරම් වේවැල් කපා ගෙනැවිත් ඇත. රඳාවඩුන්න ග්‍රාමයේත් ඒ අවට ග්‍රාමවලත් වේවැල් බහුල වශයෙන් පැවති බව ගම්වැසියෝ ප්‍රකාශ කරති. එහෙත් වර්තමානයේ කිසිදු ස්ථානයකින් වේවැල් සොයාගත නොහැකි ය. එමනිසා අම්පාර, මනම්පිටිය, බිබිල වැනි ලංකාවේ නොයෙක් ප්‍රදේශවලින් වේවැල් ගෙන්වා ගැනීම සිදුකරයි. භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදාගන්නා වේවැල් වර්ග කිහිපයකි. එනම්,

- සුදු වේවැල්
- කම්බොටු වේවැල්
- හීන් වේවැල්
- මා වේවැල්
- පොළොන්නරු වේවැල්
- නර වේවැල්
- තුඩරැල්
- එළ වැල්
- කැකුළු වැල්
- කෝර වැල් (මැලේසියා වැල්)
- ගෙඩි වැල් ආදියයි.

අමුවෙන් කපාගෙන එනු ලබන වේවැල් ජලයේ සෑදෙන නිසා ඒවායේ පවතින ජලය පළමුව ඉවත් කිරීම සිදු කළ යුතු වේ. ඒ සඳහා අමු වේවැල් කෙළින් කර තබනු ලැබේ. මෙසේ ජලය ඉවත් නොකළහොත් අවශ්‍ය පරිදි

නවා ගැනීම කළ නොහැකි වේ. සතියක පමණ කාලයක් පොළොවේ එසේ තිරස් අතට දැමීම සිදු කරයි. හොඳින් ජලය ඉවත් වූ පසු වේවැල් නවාගනු ලබයි. වේවැල් කැබැල්ලක් ගෙන එය භූමිතෙල් භාජනයක පොගවා පන්දමක් සාදාගෙන එම දැල්ලෙන් වේවැල් නැමීම පැරණි ම ක්‍රමය වේ. අනතුරු ව භූමිතෙල් දමා හුළං ගැසූ බෝ ලැම්ප් නම් ලාංපුවට වේවැල් අල්ලා රත්කර නැමීම සිදුකරයි. එය තවදුරටත් වර්ධනය වී පසු කාලීන ව ගෑස් ටෝච් නම් උපකරණය භාවිතයට පැමිණ ඇත. වේවැල් නැමීමේ දී අච්චු කඳ ද වේවැල් හීනියට ඉරා ගැනීම සඳහාත් මැදීම සඳහාත් අච්චු තලය උපයෝගී කරගනී. මෙලෙස නවාගත් වේවැල් එකට සම්බන්ධ කිරීම සඳහා ලී ඇණ හා යකඩ ඇණ උපයෝගී කරගනු ලබයි. අනතුරුව සිය පාරම්පරික දැනුම ඔස්සේ වේවැල් විවීම සිදු කරනු ලබයි. භාණ්ඩ නිමවුම් සඳහා ද්‍රව ආරක්ෂක ආලේප කර වෙළඳ පොළට අවශ්‍ය භාණ්ඩ සැපයීම සිදු කරයි.



ඡායාරූප අංක 01 (වේවැල් භාණ්ඩ නිෂ්පාදනය)

එලෙස වේවැල් කර්මාන්තකරුවන් විසින් සකස් කරන ලද වේවැල් නිෂ්පාදන රාශියකි. වට්ටි, පෙට්ටි, ඉඳි ආප්ප තට්ටු, කිරි ගොටු, විවිධ පුටු වර්ග, අල්මාරි, කබඩ්, ඇඳන්, වේවැල් කූඩ සහ වෙනත් විසිතුරු භාණ්ඩ රාශියක් නිෂ්පාදනය කිරීමට මොවුන් සතු ව විශේෂ හැකියාවක් පවතී. වේවැල් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ දී ඒවායේ ආකර්ෂණීය භාවය උදෙසා,

- කිරිබත් කැට රටාව
- තෙත්තු රටාව
- ගස්ලබු රටාව
- මුද්ද රටාව
- දැල් රටාව
- පිඹුර රටාව
- කොයිල් රටාව

වැනි රටාවන් භාවිත කරනු දැකගත හැකි ය.



ඡායාරූප අංක 02 (අලංකාර වේවැල් භාණ්ඩ)

## වර්තමාන තත්ත්වය

රදාවඩුන්න ග්‍රාමය කේන්ද්‍ර කොටගෙන පවත්නා මෙම කර්මාන්තය මේ වන විට පවතින්නේ විශාල අර්බුදයක ය. ගම්වැසියන් මේ වන විට වේවැල් කර්මාන්තය අත්හරිමින් පවතී. ආරම්භයේ දී පවුල් 125ක් පමණ මෙහි නියැළී සිටි අතර අදවන විට පවුල් 25ක් පමණ මෙම කර්මාන්තයේ නියැළී සිටී.

ගම්වැසියන් පවසන ආකාරයට මීට හේතු වී තිබෙන්නේ පවතින උග්‍ර වේවැල් හිඟය සහ වෙළඳපොළ සම්බන්ධයෙන් පවතින ගැටළු ය.

කුලියාපිටියෙන් වේවැල් ගෙන්වුව ද අද වන විට වේවැල් ප්‍රවාහනය සඳහා රජය විසින් බලපත්‍ර නිකුත් කරනු නොලබයි. වේවැල් හිඟය හේතුවෙන් මැලේසියාවෙන් වේවැල් ආනයනය කෙරුණ ද වේවැල් කිලෝවක මිල රුපියල් 1800 ද ඉක්මවයි. මෙවැනි පාඩු ලබන තත්ත්වයක් නිසා ගම්වැසියන් මෙම කර්මාන්තයෙන් ඉවත් වීමට කටයුතු කරන අතර නව පරම්පරාව ද මෙහි නියැලීමට මැළිකමක් දක්වයි. නිෂ්පාදන වියදම අධික වීම හේතුවෙන් දේශීය වශයෙන් නිපදවෙන වේවැල් භාණ්ඩවල මිල අධික වීම නිසා චීනයේ නිෂ්පාදනය කළ වේවැල් භාණ්ඩ අලෙවි කිරීමට වෙළඳුන් යොමුව තිබේ. චීනයෙන් ආනයනය කළ භාණ්ඩවල මිළ අඩුවීම මෙයට හේතුවයි.

රඳාවඩුන්න ප්‍රදේශයේ ජනතාවට කර්මාන්තයට අවශ්‍ය පුහුණුව සහ අනෙකුත් පහසුකම් සැලසීමට ආරම්භ කර තිබූ වේවැල් මධ්‍යස්ථානය ද මීට වසර තුනක පමණ කාලයක සිට වසා දමා තිබේ. ජනතාව වැඩිදුරටත් පෙන්වා දෙන්නේ සිය නිෂ්පාදන සඳහා විදේශිකයන්ගෙන් වැඩි ඉල්ලුමක් පවතින හෙයින් නිසි අනුග්‍රහයක් හා අවධානයක් රජයෙන් ලැබේ නම් වේවැල් භාණ්ඩ අපනයනය තුළින් ඉහළ ආදායමක් උපයාගත හැකි බව ය. රඳාවඩුන්න ග්‍රාමය හස්ත කර්මාන්ත ගම්මානය ලෙස නම් කර තිබුණ ද හස්ත කර්මාන්ත නගා සිටුවීමට රජයේ කිසිදු ක්‍රමවේදයක් නොපවතී. මේ නිසා මෙම සංකල්පය ඇති කළ කුඩා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ හා සාම්ප්‍රදායික කර්මාන්ත අමාත්‍යාංශයේ බලධාරීන්ගේ අවධානය මේ කෙරෙහි යොමු විය යුතු ය. එසේ ම රැකගත යුතු දේශීය කර්මාන්තයක් වශයෙන් වේවැල් කර්මාන්තය ආශ්‍රිත ව පවත්නා දැනුම සංරක්ෂණය කිරීමට පියවර ගත යුතු ය.

බොහෝ සාම්ප්‍රදායික කර්මාන්ත අනුව කළ ක්‍රමයක් නිර්මාණය වී තිබීම නූතන පරපුර එයින් ඈත් වීමට හේතුවක් වී ඇත. ගතානුගතික අදහස් දුරුකොට පරිසර හිතකාමී මෙන් ම විදෙස් විනිමය උපයාගත හැකි මෙවැනි කර්මාන්තවලට නව පරපුර නැඹුරු කළ යුතු ය. පරිසරයට හානිකරන පොලිතීන්, ප්ලාස්ටික් වැනි දේ ප්‍රතිචක්‍රීකරණයට වාර්ෂිකව වැයවන මුදල මෙවැනි කර්මාන්තවල දියුණුවට යොදාගත හැකි ය. වේවැල් හෝ පරිසර හිතකාමී ද්‍රව්‍ය දෛනික ජීවිතයට එකතු කරගන්නේ නම් ඉතා අගනේ ය.

මේ අනුව දේශීය හස්ත කර්මාන්තයක් වශයෙන් වේවැල් කර්මාන්තය ශ්‍රී ලංකාවේ දේශීය අනන්‍යතාවය පෙන්නුම් කරන සංකේතයක් ලෙස පෙන්වා දිය හැකි ය.

මෙම කර්මාන්තය වර්තමානය වනවිට සීමිත පිරිසකට සීමා වී ඇති අතර ආදේශක භාණ්ඩ භාවිතයට ගැනීමෙන් වේවැල් භාණ්ඩ නිෂ්පාදන අලෙවිය අවම වීමට හේතු වී ඇත.

## පරිශීලන ග්‍රන්ථ නාමාවලිය

සමරවික්‍රම, තරංග.(2016) ***සඳකිරණ***: සරසවි පොත් මැදුර, නුගේගොඩ.

කුමාරස්වාමි, කේ.ආනන්ද. (1994) ***මධ්‍ය කාලීන සිංහල කලා***: ලංකා රජයේ මුද්‍රණාලය, කොළඹ 08.